# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/43 - 2024 සැප්තැම්බර් මස 14 වැනි සෙනසුරාදා - 2024.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය යටතේ වූ නියමය**

1977 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන ප්‍රකාරව අදාළ ලිඛිත නීතියට අනුකූලව පිහිටුවා ඇති ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම සඳහා පවත්වන 2024 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඒ ඒ පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළ යුතු වියදම් සීමාවන්, තරග කරන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් කර ඇත.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 14 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

1A - G 42705 — 49 (2024/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

01. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම සඳහා තරග කරන එක් අපේක්ෂකයකු විසින් තම කොට්ඨාසයේ වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි එක් ඡන්දහිමියෙකු වෙනුවෙන් රුපියල් 20/- කට (රුපියල් විස්සකට) නොවැඩි මුදලක් බැගින් සිය මැතිවරණ වියදම් ලෙස එකී අපේක්ෂකයා තරග කරනු ලබන කොට්ඨාසය තුළ වැය කළ හැකි ය. ඒ අනුව, එක් එක් කොට්ඨාසය තුළ තරග කරන අපේක්ෂකයකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව මතු දැක්වේ. (ඇමුණුම - 01 හි අදාළ මුදල දක්වා ඇත.

02. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3(4) වගන්තිය ප්‍රකාරව, ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමට වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි, එක් ඡන්දහිමියෙකු වෙනුවෙන් වැය කිරීමට නිශ්චය කරන ලද රුපියල් 20/- කට (රුපියල් විස්සකට) නොවැඩි මුදල සහ ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමට වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි සමස්ත ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව අනුව ගණනය කරන ලද හිමිකම් ලබන මුදලේ;

I. සියයට හැටක (60%) ප්‍රතිශතයක් ඇල්පිටිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද (ඇමුණුම 01 හි අදාළ මුදල දක්වා ඇත)

II. සියයට හතළිහක (40%) ප්‍රතිශතය, අතිරේක නාමයෝජනා පත්‍රය හෙවත් දෙවන නාමයෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂක සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන මුදල, එක් එක් අතිරේක අපේක්ෂකයෙකුට ද (ඇමුණුම 01 හි අදාළ මුදල දක්වා ඇත)

ස්වකීය මැතිවරණ වියදම් ලෙස ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා වැය කළ හැකි ය.

03. මැතිවරණ ප්‍රචාරණ වියදම් ඇතුළත් විගණනය කරන ලද වියදම් වාර්තා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත අදාළ පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම සහ සෑම අපේක්ෂකයකු විසින්ම සකස් කොට පක්ෂ ලේකම්ගේ අත්සන, ස්වාධීන කණ්ඩායම් නායකයාගේ අත්සන සහ අපේක්ෂකයාගේ අත්සන, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සනාථ කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

අදාළ වාර්තාවේ,

I. පිළිගත් දේශපාලන පක්ෂය, ස්වාධීන කණ්ඩායම හා අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග,

II. එකී පරිත්‍යාග, දායකත්ව සිදු කළ තැනැත්තාගේ හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සකස් කළ බදුකරු හඳුනාගැනීමේ අංකය (TIN අංකය) හෝ ලියාපදිංචි අංකය ද

සඳහන් කළ යුතු ය.

මෙම වාර්තාවේ,

(අ) ජනමාධ්‍යක හෝ වෙනත් ආකාරයක කටයුතු පිළිබඳ වියදම් (ප්‍රචාරණ දැන්වීම්, අත් පත්‍රිකා, ධජ, පතාක, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර පෝස්ටර් ආදී),

(ආ) ගුවන්විදුලි හෝ රූපවාහිනී ප්‍රචාර;

(ඇ) පුවත්පත්, වාර සඟරා, සමාජ මාධ්‍ය, ඩිජිටල් පුවරු හෝ ඕනෑම ඩිජිටල් මාධ්‍යක හෝ වෙනත් ප්‍රකාශන;

(ඈ) වාහන ධාවනයට ඉන්ධන සැපයීම;
ආදිය සඳහා ගෙවීම් සිදු කළේ ද නැද්ද තහවුරු කරන බිල්පත් කුවිතාන්සි ගෙවීම් රහිතව ලබා ගන්නේ නම් එම සේවාව ලබා ගත් තැනැත්තාගේ නම සහ ලිපිනය

ඇතුළත් කළ යුතු ය.

මෙහිදී,

(අ) ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශය තුළ අපේක්ෂකයන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා සහ,

(ආ) ලිපි ද්‍රව්‍ය, දුරකතන හෝ වෙනත් ආකාරයක සන්නිවේදන කටයුතු සඳහා

කරනු ලැබූ වියදම් ඉහත වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය.

04. එම වාර්තා දින 10ක් (දහයක්) ඇතුළත ලැබීමෙන් පසුව එම ප්‍රකාශන ලැබී ඇති බවට සහ ඒ වාර්තා ප්‍රකාශන යම් තැනැත්තකුට පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය හා වේලාවන් දක්වමින් තේරීම්භාර නිලධාරියා හෝ මැතිවරණ කොමිෂන් සභාව හෝ විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් එක් ජාතික පුවත්පතක හෝ දැන්වීමක් පළ කරනු ලබනු ඇත.

05. ඕනෑම තැනැත්තෙකුට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද යම් ගාස්තුවක් ගෙවීමෙන් පසුව එම වාර්තා ප්‍රකාශවල පිටපතක් ලබා ගත හැකි වේ. අදාළ ගාස්තු ප්‍රමාණය එකී තේරීම්භාර නිලධාරී වෙතින් දැනගත හැකි ය.

06. පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ විසින් නියමිත දිනට අදාළ වාර්තා භාර නොදීම හෝ එකී වාර්තාවල දෝෂ සහිත වීම නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරන අතර, නීතිවිරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් 1977 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) ආඥාපනතේ (262 අධිකාරය) සඳහන් දණ්ඩනයට යටත් කරනු ලබනු ඇත.

07. (1) 2024 ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු විසින්,

(අ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ යම් කොටස් ප්‍රමාණයක් රජය විසින් හෝ යම් කොටස් ප්‍රමාණයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හිමිකාරීත්වය දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වෙතින්;

(ආ) විදේශීය රාජ්‍යකින්, ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලැබූ පුද්ගල මණ්ඩලයකින්;

(ඇ) ඍජුව හෝ වක්‍රව විදේශීය කොටස් හිමිකාරීත්වය සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ සමාගම්වලට අදාළ පූර්වකාලීන යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද යම් සමාගමකින්; හෝ

(ඈ) අනන්‍යතාවය හෙළි නොකරන ලද යම් තැනැත්තකුගෙන්;

ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ මැතිවරණ ප්‍රවර්ධනය කිරීමේ හෝ ඊට ඉඩ සැලසීමේ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයකු හෝ ඒ වෙනුවෙන් මුදලින් හෝ ද්‍රව්‍යමය ආකාරයකින් ඍජුව හෝ වක්‍රව ඒ පරිත්‍යාග හෝ දායකත්වයන් පිළිගැනීම හෝ භාර ගැනීම නොකළ යුතු ය.

(2) (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් අපේක්ෂකයකු ඒ මැතිවරණය පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන අර්ථානුකූලව නීතිවිරෝධී ක්‍රියාවක් වන වරදක් සිදු කරන අතර, නීතිවිරෝධී ක්‍රියාවක් වන වරදක් සම්බන්ධයෙන් 1977 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) ආඥාපනතේ (262 අධිකාරය) යටතේ පනවනු ලැබ ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.

ඇමුණුම **01**

| පරිපාලන දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතනය | කොට්ඨාසය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | තීරණය කරන ලද මුදල (රු.) | අපේක්ෂකයකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු.) |
|---|---|---|---|---|---|
| ගාල්ල | ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | අවිත්තාව | 3066 | 20 | 61,320.00 |
| | | ඕමත්ත | 4244 | 20 | 84,880.00 |
| | | මැටිවිලිය | 2186 | 20 | 43,720.00 |
| | | ඉඳිපලේගොඩ | 2620 | 20 | 52,400.00 |
| | | අමුගොඩ | 3265 | 20 | 65,300.00 |
| | | කැටන්දොල | 2800 | 20 | 56,000.00 |
| | | ඇල්පිටිය | 3604 | 20 | 72,080.00 |
| | | නවදගල | 3594 | 20 | 71,880.00 |
| | | බටුවන්හේන | 4475 | 20 | 89,500.00 |
| | | තලාව | 3894 | 20 | 77,880.00 |
| | | කුඩාගල කදිරන්දොල | 4658 | 20 | 93,160.00 |
| | | වල්ලඹගල | 2536 | 20 | 50,720.00 |
| | | පිටුවල | 2780 | 20 | 55,600.00 |
| | | ඇල්ල | 3360 | 20 | 67,200.00 |
| | | අම්බන කහඳුව | 3133 | 20 | 62,660.00 |
| | | පිණිකහන | 3043 | 20 | 60,860.00 |
| | | තිබ්බොටුවාව | 2385 | 20 | 47,700.00 |
| එකතුව | | | **55643** | | **1,112,860.00** |

| | |
|---|---|
| ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට හෝ වැය කළ හැකි උපරිම වියදම් සීමාව | **667,716.00** |
| ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා අතිරේක ලැයිස්තුවේ එක් අපේක්ෂකයෙකු විසින් වැය කළ හැකි උපරිම වියදම් සීමාව | **31,796.00** |

EOG 09 - 0119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.